**සී/ස සතොස ඉදිකිරීම් හා ඉංජිනේරු (පුද්ගලික) සමාගම -2016**
------------------------------------------------------------------------
**සී/ස සතොස ඉදිකිරීම් හා ඉංජිනේරු (පුද්ගලික) සමාගමේ (''සමාගම') 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් මාස නවය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මාස නවය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.**

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම**
-----------------------------------------------------------------
**මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට (SLPSAS) අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ (''මණ්ඩලය'') වගකීම වේ.**

**1.3 විගණකගේ වගකීම**
----------------------
**මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව මාගේ විගනණය සිදු කරන ලදී කෙසේ වෙතත්,මතය ව්‍යාවනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතය සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් උචිත සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.**

**1.4 මතය ව්‍යාවනය සඳහා පදනම**
--------------------------------
**(අ) රු. 152,113,025 ක වටිනාකමක් සහිත පහත සඳහන් ගිණුම් අයිතම එක් එක් අයිතමය ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි ඉදිරිපත් නොවීම හේතුවෙන් සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.**

| | ගිණුම් අයිතමය | වටිනාකම | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|---|
| | | රු. | |
| (i) | උප කොන්ත්‍රාත් කරුවන්ට ගෙවිය යුතු ශේෂ | 19,363,597 | ඉන්වොයිස්පත් |
| (ii) | 2016 අප්‍රේල් 01 දිනට ගෙවිය යුතු රඳවා ගැනීම් | 11,097,065 | ඉන්වොයිස්පත්, කොන්ත්‍රාත් ගිවිසුම් සහ කල වැඩ වාර්තා |
| (iii) | මුදා හරින ලද රඳවා ගැනීම් | 5,860,484 | ඉන්වොයිස්පත්, කොන්ත්‍රාත් ගිවිසුම් සහ කල වැඩ වාර්තා |
| (iv) | එකතු කළ අගය මත බදු ආපසු ගෙවීම | 26,402,994 | ඉන්වොයිස්පත් |
| (v) | ජාතිය ගොඩනැගීමේ බදු | 4,060,326 | ඉන්වොයිස්පත් |
| (vi) | ලියාපදිංචි ගාස්තු , ටෙන්ඩර් ගාස්තු (ආපසු නොගෙවන) ප්‍රමාද ගාස්තු (ටෙන්ඩර්) | 657,000 | ලදුපත් |
| (vii) | අත්තිකාරම් ගෙවීම් | 55,509,640 | ඉන්වොයිස්පත් සහ පියවීමේ වවුචර් |
| (viii) | ගෙවියයුතු උපදේශන ගාස්තු | 4,266,649 | ඉන්වොයිස්පත් සහ ගෙවීම් වවුචර් |
| (ix) | භාණ්ඩ සැපයීම් - ණයහිමියෝ | 24,895,270 | ඉන්වොයිස්පත් සහ භාණ්ඩ ලැබීමේ පත්‍රිකා |
| | | 152,113,025 | |

**(ආ) ඇමතුම් තැන්පතු දෙකකට අදාළ ලැබිය යුතු පොලී මුදල වූ රු. 1,722,794 ක් මූල්‍ය ප්‍රකාශන වල සටහන් කර නොතිබුණි.**

(ඇ) ණය ගැතියන්ගෙන් ලද රු. 68,923,201 ක් ණයහිමියන් ලෙස ගිණුම්ගත කර තිබුණි. එබැවින්, ජංගම වගකීම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

**2.** මූල්‍ය ප්‍රකාශන

**2.1** මතය ව්‍යාවනය

මතය ව්‍යාවනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණු වල වැදගත්කම හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මට නොහැකි විය. ඒ අනුව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

**2.2** වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතාවයන් පිළිබඳ වාර්තාව

2007 අංක 07 දරන සමාගම් පනතේ 163(2) වගන්තිය මගින් නියම කරන පරිදි මා විසින් පහත සඳහන් ප්‍රකාශ සිදුකරමි.

(අ) මතය සඳහා පදනම සහ විගණනයේ විෂය පථය හා සීමා කිරීම් ඉහත දක්වා ඇති පරිදි වේ.

(ආ) මාගේ මතය වනුයේ:

ඉහත දක්වා ඇති පරිදි විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා හට ලබා ගැනීමට නොහැකි වූ අතර එබැවින් මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ නොකරමි.

**2.3** නීති, රීති හා රෙගුලාසිවලට සහ කළමනාකරණ තීරණවලට නුකූල නොවීම

| | නීති / මග පෙන්වීම සඳහා යොමුව | විස්තරය |
|---|---|---|
| (අ) | 2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක පීඊඩී / 12 | |
| 1 | 5.2.5. වගන්තිය | වාර්ෂික අයවැය ලේඛනය සකස් කර රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරය සහ විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| 11 | 9.2 වගන්තිය | සමාගම සඳහා කාර්ය මණ්ඩල සංඛ්‍යා සකස් කර අනුමත කර නොතිබුණි. |

**3.** මූල්‍ය සමාලෝචනය

**3.1** මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත මාස නවය සඳහා සමාගමේ මෙහෙයුම් වලින් ලද ප්‍රතිඵලය රු.2,233,083 ක බදු පසු ශුද්ධ ලාභයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ බදු පසු ශුද්ධ ලාභය රු.677,266 ක් වීමෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.1,555,817 වර්ධනයක් පෙන්නුම් කරන ලදී. සමස්ත වියදම රු. 7,360,701 කින් වැඩිවීමට එරෙහිව සමස්ත අදායම රු. 8,515,819 කින් වැඩිවීම මූල්‍ය ප්‍රතිඵලයෙහි වර්ධනයට ප්‍රධාන හේතුව වී තිබුණි.

**4.** ගිණුම් කටයුතු භාවය සහ යහ පාලනය

**4.1** සංයුක්ත සැලැස්ම

**2003 ජූනි 02 දිනැති අංක පීඊඩී / 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1 වගන්තිය ප්‍රකාරව සමාගම විසින් 2012 වර්ෂයේ සිට සංයුක්ත සැලැස්මක් සකස් කර නොතිබුණි.**

**4.2** ක්‍රියාකාරී සැලැස්ම

**2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව, සමාගම විසින් ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි.**

**4.3** අභ්‍යන්තර විගණනය

**2009 ජූනි 09 දිනැති අංක ඩීඑම්ජී /2009(1) දරන විගණන හා කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව සමාගම විසින් අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි.**

**4.4** විගණන කමිටු

**2003 ජූනි 02 දිනැති අංක පීඊඩී / 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.1 වගන්තිය ප්‍රකාරව විගණන කමිටුවක් පිහිටුවා නොතිබුණි.**

**5.** පද්ධති හා පාලන

**විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා වරින් වර සමාගමේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කිරීම අවශ්‍ය වේ.**

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණය |
|---|---|
| වත්කම් කළමනාකරණය | සමීක්ෂණ මණ්ඩල මගින් වත්කම් සත්‍යාපනය කර නොතිබීම |
| ගිණුම්කරණය | ලෙජරයේ ගිණුම් ශේෂයන් උපයෝගී ලේඛන සමඟ තහවුරු කර ගැනීමට නොහැකිවීම |
| මානව සම්පත් කළමනාකරණය | කාර්ය මණ්ඩල සංඛ්‍යා සඳහා භාණ්ඩාගාරයෙන් අනුමැතිය ලබා නොගැනීම |